# කාලාම සූත්‍රය හා විශ්වාසය

සසර සැරිසරන සත්ත්වයා ගැන සාමාන්‍ය ඉන්ද්‍රියවලින් දත නොහැකි වුව ද, අභිඥා මගින් දැකගත හැකි යැයි කියැවෙයි. අභිඥා නුපදවා ගත් අයකුට එය නිශ්චිත ව කිව හැකි කරුණක් නොවන නමුදු ඒ පිළිබඳ තමන් විසින් විශ්වාස කෙරෙන සාධු ජනයා, එසේත් නැත්නම් කාලාම සූත්‍රයේ දැක්වෙන විඤ්ඤූන්, අභිඥා මගින් සත්ත්වයා සසර සැරිසරන බව දැක තිබෙන්නේ යැයි කී විට එය විශ්වාස කිරීමට සිදු වෙයි. පසුගියදා ඇමරිකා එක්සත් ජනපදය මගින් අඟහරු ග්‍රහයා මත ස්පිරිට් නම් යානය ගොඩ බස්සවන ලදී. එලෙස යානයක් ගොඩ බැස්සූ බව අප දන්නේ කෙසේ ද? ඇතැමුන් ඒ සිද්ධිය රූපවාහිනියෙන් දැක ගන්නට ඇත. එහෙත් මෙතරම් තාක්ෂණය දියුණු වී ඇති යුගයක ඒ ඡායාරූප කුමකින් කුමක් විය හැකි ද? සමහර විට එ ඡායාරූප පොළාව  මත ම වෙනත් කැමරාවකින් ඡායාරූප ගතකරන ලද පොළොවේ කාන්තාරයක දර්ශන විය හැකි ය. ඩිජිටල් තාක්ෂණය යොදා ගනිමින් නොපවතින වස්තුවල වුව ද ඡායාරූප නිර්මාණය කළ හැකි ය. මෙහි දී ද බොහෝ අවස්ථාවල දී මෙන් ම විශ්වාසය වැදගත් වෙයි. අප කුමක් කීව ද අපේ නිගමන බොහෝමයක් විශ්වාසය මත රඳා පවතියි. විශ්වාසය තබන්නේ වෙනත් පුද්ගලයන් කරන කියන දෑ මත වීම මෙහි දී කැපී පෙනෙන ලක්ෂණය වෙයි.

අප ඒ ඡායාරූප ගැන කිසිම සැකයක් ඇතිකර නොගන්නේ ඇයි? එයට හේතුව අවශ්‍ය නම් අපට ද ඒ ඡායාරූප පරීක්ෂා කර ඒ අව්‍යාජ බව දැන ගැනීමට හැකි වීම යැයි කියැවෙයි. එහෙත් එලෙස කිරීමේ දී අපට මහා දැනුම් සම්භාරයක් ලබා ගැනීමට සිදුවෙයි. ඩිජිටල් ඡායාරූපකරණය ගැන පමණක් නොව රොකට් තාක්ෂණය, අඟහරු ග්‍රහයාගේ ගති ස්වභාව ආදිය පිළිබඳ ව ද දැනුමක් එහි දී අවශ්‍ය වෙයි. ඒ දැනුම ලබාගැනීමට උත්සාහ නොකරන අපි ඒ පිළිබඳ විශේෂඥයන් යැයි කියන්නන් ප්‍රකාශ කරන දේ සැකයකින් තොරව පිළිගන්නෙමු. මෙහි දී සිදුවන්නේ කුමක් ද? සමාජය විසින් ඇතැම් කටයුතු සම්බන්ධයෙන් ඇතැම් පුද්ගලයන් කෙරෙහි අප තුළ විශ්වාසයක් ඇති කෙරෙයි. විද්‍යාඥයන් යැයි කියනු ලබන්නන් ගැන විද්‍යාත්මක කරුණු යැයි කියැවෙන දේ සම්බන්ධයෙන් අපේ විශ්වාසයක් ගොඩ නගනු ලැබ ඇත. මේ විශ්වාසය ගොඩනගනු ලැබ ඇත්තේ ආකෘතික අධ්‍යාපනයක් ලබාදෙන පාසල් හා විශ්ව විද්‍යාල වැනි ආයතන විසින් මෙන් ම අනාකෘතික අධ්‍යාපනයක් ලබාදෙන දෙමව්පියන්, වැඩිහිටියන්, මිතුරන් ආදීන් හා ජනමාධ්‍ය (කටකතා ද ජනමාධ්‍යයක් වෙයි) මගිනි. ඒ ඒ සමාජය විසින් ඒ ඒ කරුණු සම්බන්ධයෙන් විශ්වාස කළයුතු, අනුගමනය කළයුතු  පුද්ගලයෝ කවුරු දැයි නියම කෙරෙති; හඳුනාගැනෙති. එවැනි විශ්වාසයක් නොමැතිව අපට අපේ කටයුතු කරගත හැකි නොවේ. අපට යම් කාලයක දී සමාජයේ ඇති සියළු දැනුම, විශේෂයෙන්ම අද වැනි යුගයක ලබාගත හැකි නොවේ.

එහෙත් ප්‍රශ්නය එය නොවේ. විද්‍යාඥයන් යැයි කියනු ලබන්නන් කියන කරන දේ සැකයකින් තොර ව පිළිගන්නා අපි වෙනත් එවැනි දේ සම්බන්ධයෙන් එසේ නොකරමු. සත්ත්වයා සසර සැරිසරන බව අප දන්නේ කෙසේ ද? අපේ ඉන්ද්‍රියවලට ඒ ගෝචර නොවේ. එහෙත් අභිඥා උපදවා ගත් අයට සසර ප්‍රත්‍යක්ෂයෙන් ම දත හැකි බව කියැවෙයි. බුදුන් වහන්සේ ද සසර ගැන දේශනා කර ඇත. අවශ්‍ය නම් අපට ද අභිඥා උපදවා සසර පිළිබඳ දැනුම ප්‍රත්‍යක්ෂයෙන් ම ලබාගත හැකි ය. එහෙත් අපට ඒ සඳහා විවේකයක් නැත. එබැවින් අපි අභිඥා ලබා ගැනීම සඳහා වෙහෙසක් නොගනිමු. ඒ අතර අභිඥා ලත් අය කියා ඇති දේ ද විශ්වාස නොකරමු. බටහිර විද්‍යාඥයන් සම්බන්ධයෙන් අප ක්‍රියා කරන්නේ එයට හාත්පසින් ම විරුද්ධ ආකාරයකට ය. එහි දී ඇතැමකු කියනු ඇත්තේ බටහිර විද්‍යාඥයන් කියන දේ අවශ්‍ය නම් අපට ද අත් දැකීමෙන් ම දැනගත හැකි බව ය. ඒ සඳහා අවශ්‍ය පරීක්ෂණ ඕනෑම අයකුට කළ හැකි යැයි ද ඔවුන් පවසනු ඇත.

එහෙත් මෙය වැදගත් තර්කයක් නොවේ. මේ අතනින් මෙතනින් කරුණු අහුලාගෙන කතාකරන, පුවත්පත්වලට ලියන බොරු ප්‍රබුද්ධයන්ගේ කසිකබල් තර්ක ය. මෙවැනි තර්ක ගෙනෙන බොහෝ දෙනාට බටහිර විද්‍යාව ඉගෙනීමට තරම්වත් අවශ්‍ය විශ්ලේෂණාත්මක බුද්ධියක්, වියුක්ත මනසක් නැත. එහෙත් ඔවුහු බටහිර විද්‍යාවට දණ්ඩ නමස්කාර කරති. බටහිර භෞතික විද්‍යාව පසුපස නොන්ඩි ගසන කසිකබල් බටහිර සමාජයීය විද්‍යා ඉගෙන ඊනියා විද්‍යාව ගැන දොඩවන හා ලියන බොරු ප්‍රබුද්ධයන් තරම් දීනයන් පිරිසක් මෙරට බිහි වී නොමැති යැයි මම සිතමි. එහෙත් මොවුන් පත්තරවලට ලියන්නේ කියවන්නේ මහා ප්‍රබුද්ධයන් මෙනි.

© Prof. Nalin De Silva

බටහිර විද්‍යාවේ කෙරෙන පරීක්ෂණ ඕනෑම අයකුට කළ හැකි දෑ නොවේ. අර කසිකබල් සමාජයීය විද්‍යාඥයන්ට නම් ඒ කිසි දිනක නොකළ හැකි ය. ඔවුන්ට ඒ සඳහා අවශ්‍ය බුද්ධිය හා මනස නැත. අනෙක් අතට ඇතැම් පරීක්ෂණ කිරීමට විශාල මුදලක් වියදම් කිරීමට සිදුවේ. අඟහරු ග්‍රහ වස්තුව ගැන කරන පරීක්ෂණ ලංකාවේ රජය මැදිහත් වීමෙන්වත් නොකළ හැකි ය. ලංකාවේ අපට කළ හැක්කේ එතරම් මුදලක් වැය නොවන සුළු සුළු පරීක්ෂණ පමණ ය. අපට බටහිර විද්‍යාඥයන් කියන බොහෝ දේ කිසිම පරීක්ෂණයකින් තොරව පිළිගැනීමට සිදු වී ඇත. එසේ පිළිගන්නා අපි සසර ගැන අභිඥා උපදවා ගත් අය කියන දේ නොපිළිගනිමු. එහි දී ද අවශ්‍ය නම් අපට ද අභිඥා උපදවාගෙන අපේ ම අත්දැකීම් ලබාගත හැකි ය. අපි එය ද නොකරමු. අපි ඒ සඳහා නොවෙහෙසෙමු. ඒ වෙනුවට බොරු විද්‍යාත්මක ක්‍රමය, කාලාම සූත්‍රය ආදිය ගැන අපි නොදන්නා දේ, අතනින් මෙතනින් අහුලාගත් දේ වමාරන්නෙමු. අප බටහිර විද්‍යාඥයන් කියන දේ කිසිම පරීක්ෂණයක් නොකර පිළිගන්නේත්, සසර ගැන අභිඥා උපදවා ගත් අය කියන දේ නොපිළිගන්නේත්, අභිඥා උපදවා ගැනීමට උත්සාහ නොකරන්නේත් මේ සමාජයේ බටහිර විද්‍යාඥයන් පිළිගත යුතු පිරිසක් බවටත් අභිඥා ලත් අය නොපිළිගත යුතු ආචීර්ණකල්පිත අදහස් දැරූ ඊනියා මැන්ටල් බවටත් පත්කර තිබීම නිසා ය.

කාලාම සූත්‍රය ගැන කතාකරන බොහෝ දෙනා ඒ සූත්‍රය කියවා නැති බව පැහැදිලි ය. බොහෝ දෙනා දන්නේ කාලාම සූත්‍රයෙන් කොටසකි. කාලාම සූත්‍රයෙහි, යමකු කී නිසාවත්, පොතපතක ඇති නිසාවත්, න්‍යායානුකූල වූ නිසාවත්, පරම්පරාවෙන් ආ නිසාවත් ආදී වශයෙන් කරුණු කිහිපයක් නිසාවත් යමක් නොපිළිගත යුතු බව බුදුන් වහන්සේ දේශනා කර ඇති කොටස පමණක් බොහෝ දෙනා දනිති. එහෙත් සූත්‍රයෙහි අනෙක් කොටස් හා එහි පසුබිම ගැන නොදනිති. කාලාම සූත්‍රය දේශනා කිරීමට හේතුවූයේ කාලාමයන් තමන් වසන ගමට පැමිණි විවිධ අය විවිධ දේ කී බැවින් පිළිගත යුත්තේ කුමක් දැයි තීරණය කරගැනීමට නොහැකි ව ඒ පිළිබඳ ව බුදුන් වහන්සේගෙන් විමසූ බැවින් ය. එහි දී බුදුන් වහන්සේ ඉහත කී පරිද්දෙන් යම් යම් කරුණු ප්‍රමාණවත් නොවන බව දේශනා කළහ. උදාහරණයක් වශයෙන් ගතහොත් උන්වහන්සේ පොතක පතක තිබූ නිසාවත් පිළිනොගන්නා ලෙස දේශනා කළහ. මෙයින් කියැවෙන්නේ පොතක පතක තිබෙන දෙයක් නොපිළිගත යුතු ය යන්න නොව, පොතක පතක තිබීම යමක් පිළිගැනීමට තරම් ප්‍රමාණවත් නොවන බව ය. මේ කාලාම සූත්‍රයෙහි පළමු කොටස ය. ඒ කොටසින් බුදුන් වහන්සේ යමක් පිළිගැනීමට ඇතැම් කරුණු ප්‍රමාණවත් නොවන බව දෙසූහ.

එහෙත් කාලාමයන්ට තවත් ප්‍රශ්නයක් විය. කළ යුත්තේ කුමක් ද යන ප්‍රශ්නයට සාධනීය පිළිතුරක් කාලාම සූත්‍රයෙහි ඉහත සඳහන් පළමු කොටසින් නොකියැවෙයි. එහි හුදෙක් ප්‍රමාණවත් නොවන කරුණු කිහිපයක් සඳහන් වෙයි. කළ යුත්තේ කුමක් ද, නොකළ යුත්තේ කුමක් ද, යන්නට බුදුන් වහන්සේ කාලාම සූත්‍රයෙහි දෙන්නේ කදිම පිළිතුරකි. උන්වහන්සේ දේශනා කර ඇත්තේ විඤ්ඤූන් අනුගමනය කරමින් ඔවුන් කරන දේ කිරීමටත් නොකරන දේ නොකිරීමටත් ය. බුදුන් වහන්සේ ධර්මය සම්බන්ධයෙන් නම් එව බලව යැයි දේශනා කළ ද, එදිනෙදා ජීවිතයෙහි සැමට ම පර්යේෂණ කිරීමට යැයි නොදෙසූහ. එය බටහිර බොරු ප්‍රජාතන්ත්‍රවාදයට හා බොරු සමානත්මතාවයට නම් එකඟ වෙයි. එහෙත් ඒ බොරු කතා වෙයි. බුදුන් වහන්සේ දේශනා කෙළේ එකල සමාජයේ විඤ්ඤූන් අනුව යෑමට ය. මේ විඤ්ඤූන් යනු කාරණා දැන කියාගත් සාධු ජනයා යැයි සිතාගත හැකි ය. බුදුන් වහන්සේට අනුව එකල සමාජයේ විඤ්ඤූන් බොහෝ දේ දැනසිටියා පමණක් ඔවුන් දැනසිටි දෙය සමාජයට වැඩදායක විය.

එහෙත් දැන් ප්‍රශ්නය වනුයේ මේ විඤ්ඤූන් හැඳිනගන්නේ කෙසේ ද යන්න ය. එයට බුදුන් වහන්සේ නිශ්චිත පිළිතුරක් දී නොමැති බව සූත්‍ර දේශනවලින් පැහැදිලි වෙයි. විඤ්ඤූන් කියන කරන දේ බුදුන් වහන්සේ විස්තර නොකළහ. එසේ විස්තර නොකෙළේ විඤ්ඤූන් හඳුනාගැනීම එකල ප්‍රශ්නයක් නොවූ බැවින් යැයි සිතිය හැකි ය. එකල විඤ්ඤූන් යනුවෙන් පිරිසක් සිටි බවත් ඔවුන්ගේ වත් පිළිවෙත් බුදුන් වහන්සේ විසින් ප්‍රතික්ෂේප නොකෙරුණු බවත් පැහැදිලි ය. එදා දඹදිව විඤ්ඤූහු යනු ඒ සමාජයේ යම් සංස්කෘතික ආධිපත්‍යයක් දැරූ පිරිසක් වූහ. ඇතැම් සමාජ මිනුම් දඬු සකස් කළෝ ඔවුහු ය.

© Prof. Nalin De Silva

වත්මන් සමාජයේ ඇති බටහිර සංස්කෘතික ආධිපත්‍යය හේතුකොටගෙන, ඇතැම් කරුණු සම්බන්ධයෙන් විශ්වාස කළ යුතු අනුගමනය කළ යුතු පුද්ගලයන්, එනම් කාලාම සූත්‍රයෙහි සඳහන් අන්දමට නම් මෙකල විඤ්ඤූන්, බවට පත් වී ඇත්තේ බටහිර විද්‍යාඥයන් හා පොදුවේ ගත් කල බටහිර විශේෂඥයන් ය. බටහිරයෝ ඒ ආධිපත්‍යය වසන් කරති. සියල්ලන් සමාන යැයි කියැවෙන්නේ ඔවුන්ගේ කසිකබල් දේශපාලන විද්‍යාවේ දී පමණ ය. දැනුම සම්බන්ධයෙන් ගත්කල සියල්ලෝ ම සමාන නොවෙති. බටහිර සමාජ ආධිපත්‍යය ඇති තැන බටහිර දැනුම දන්නෝ අධිපතිවාදීහු වෙති. එහෙත් ඔවුහු එසේ නොකියති. කුහකයන් වූ බටහිරයන් කියන්නේ ඕනෑම අයකුට දැනුම පිළිබඳ පරයේෂණ කළ හැකි බව ය. බුදුන් වහන්සේට විඤ්ඤූන් සිටින බව පිළිගැනීම ප්‍රශ්නයක් නොවී ය. එයට හේතුව දැනුම සම්බන්ධයෙන්, සංස්කෘතිය සම්බන්ධයෙන්, ආධිපත්‍යයක් ඇති බව වසන් කිරීමට අවශ්‍යතාවයක් නොතිබීම ය. එහෙත් බටහිරයන්ට එවැනි ආධිපත්‍යයක් වර්තමාන සමාජයෙහි ද ඇති බව වසන් කිරීමට අවශ්‍ය වෙයි. අද අපට සංස්කෘතියෙහි දී ද, එහි කොටසක් වූ දැනුමෙහි ද, සවිඥානික ව මෙන් ම අවිඥානික ව ද බටහිරයන්ගේ මිනුම් දඬුවලට යට වීමට සිදුවෙයි.

කාලාම සූත්‍රයෙන් ඊනියා විද්‍යාත්මක විධි ක්‍රමයක් ගැන නොකියැවෙයි. එහි සම්මතය කුමක් දැයි නිර්භය ව කියා දෙනු ලැබෙයි. අද සමාජයෙහි බෞද්ධයන් කොපමණ සිටිය ද, ඔවුන්ට ආධිපත්‍යයක් කොහේත් ම නැත. ඔවුහු බටහිර ආධිපත්‍යයට යට වී සිටිති. අභිඥා උපදවා ගත් අය පමණක් නොව බුදුන් වහන්සේ ද අද පිළිගැනීමට සිදු වී ඇත්තේ බටහිර විද්‍යාඥයන්ගේ ආධිපත්‍යයට යට ව ය. අද සමාජයේ විශ්වාසයක් ගොඩ නගා ඇත්තේ බටහිර විද්‍යාඥයන් ඇතුළු ඊනියා විශේෂඥයන් මත මිස අභිඥා උපදවා ගත් අයගේ ප්‍රත්‍යක්ෂය මත ගැන නොවේ. එහෙත් ඒ විශ්වාසය, විශ්වාසයක් ලෙස ඉදිරිපත් කිරීම බටහිරයෝ ප්‍රතික්ෂේප කරති. ඔවුහු විශ්වාසය බොරු සමානත්මතාව, ප්‍රජාතන්ත්‍රවාදය, කාටත් කළ හැකි පරයේෂණ, බුද්ධිවාදය හෙවත් හේතුවාදය (rationalism) ආදිය තුළ සඟවති. එපමණක් නොව මෙරට අනුකාරකයෝ ඒ බොරු හේතුවාදය සඳහා කාලාම සූත්‍රය ද නිදර්ශනයක් ලෙස ඉදිරිපත් කරති. බුදුන් වහන්සේට සැඟවීමට දෙයක් නොතිබුණි. එකල සමාජයේ විඤ්ඤූන් යැයි හඳුන්වනු ලැබුවන්ගේ ආධිපත්‍යය සැඟවීමට උන්වහන්සේට අවශ්‍ය නොවී ය. එපමණක් නොව, උන්වහන්සේ විඤ්ඤූන්ගේ ක්‍රියාකලාපය ද අනුමත කළහ. කාලාම සූත්‍රය ඊනියා හේතුවාදයට පටහැණි බවත් හේතුවාදය යන්න බටහිරයන්ගේ ආධිපත්‍යය සැඟවීමට යොදාගන්නක් බවත් අමතක නොකළ යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva